මහගම සේකරයන්ගේ විශිෂ්ටතම නිර්මාණ සේවය සිංහල පද්‍යයට යනු සමහර විචාරකයන් පවසතත් ඔහු විසින් සිංහල ගීතයට කළ සේවාව ඊට වඩා වැදගත් බව කිව හැකිය. විටෙක ඔහු පද්‍ය සඳහා කළ සේවාව අගය කළ හැක්කේ කවිය කුමක්ද යන්න හොඳින් අවබෝධ කොටගෙන තිබීමත් ඒ සඳහා තිබූ බාදා ඉවතලා බුද්ධිමත් පිරිසක් ඒ මාර්ගයට පිවිසීමේ ගෞරවයත් ඔහුට ඒකාන්තයෙන්ම පිරිනැමේ. එහෙත් ගීත ඉතිහාසයම පිරික්සා බැලිමේදී ඔහුගේ ගීත තුළින් වහනය වන සුවඳ මුළු සංගීත ක්ෂේත්‍රය පුරාම විහිදී යයි. ගීතය ඉතාම නොදිගුණු මාවතක තිබියදී ඒ සඳහා ඔහුගේ ගීතය සඳහා වූ සේවය අගය කළ හැකිය.

ගීත ගායනය පැත්තෙන් හැරී බලන කළ ජාතියේ සමාරම්භයේ සිටම ගායනය මෙරට තිබුණ බවට කොතෙකුත් සාහිත්‍ය තොරතුරු මතින් සනාථ කළ හැකිය. නාඩගම් හා නූර්ති නාටක තුළින් අද සලකන ගීත පදමාලාවල පසුබිම සකස් වූ බව පෙන්වා දිය හැකිය. මෙහි රංගනය සඳහා ඉන්දියාවේ රාගධාරී සංගීතයත් කණිරසායන ලෙස යෙදූ තනු නිර්මාණයත් ඒ සඳහා අමාරුවෙන් රිංගවන ලද වචනත් හෙවත් පද මාලාවත් පසුකාලීනව අපට දක්නට ලැබේ. එම නාට්‍ය ගීතවල මධුර හා මිහිරි බව රඳා පැවතියේ පදමාලාවේ කොට තනුවළය. ඉතා හොඳ පද රචනාවක් දකින්නට ලැබෙන්නේ ඉතා විරලවය.

ඉහතින් සඳහන් කළ තන්වය ක්‍රමයෙන් වෙනස් වන්නේ ආනන්ද සමරකෝන් සුනිල් ශාන්ත ආදී සංගීතඥයන්ගේ ගීතයන් සමගය. සිංහල භාෂාව ගැන දැනුමක් හා ඉංදිය සංගීතය පිළිබඳ හසල වූ දැනුමක් ඇති මොවුන් තම සංගීතය සඳහා ගී පද මාලා ඔවුන් විසින්ම රචනා කළ අතර ඒවා ඉතා සුමධුර වූ ඒවා විය. එයට මූලික හේතුව වූයේ මෙම සංගීතඥයන් දෙපලම සාහිත්‍ය හා සිංහල භාෂාව පිළිබඳව ඔවුන්ගේ තිබූ හසල වූ දැනුමයි. ඉන් අනතුරුව ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ හා විමල් අනයසුන්දර වැන්නන් ගුවන්විදුලි ගීත නාටක තුළින්ද මහාචාර්ය එදිරිවීර සරචන්ද්‍රයන් සිංහල වේදිකා නාට්‍ය සඳහාද විශාල සේවාවක් සිදුකළේය. මහගමසේකර නම් ගීත රචකයෙකු පහළ වන්නේ මෙවන් පරිසරක් පසුබිම් කොටගෙන බව පෙනේ.

මහගමසේකරයන් ගීත රචකයෙකු වන්නට ආනන්ද සමරකෝන් සුනිල් ශාන්තයන් චන්ද්‍රරත්න මානවසිංහයන් වැනි උගතුන් ඔහුට බොහෝ සේ බලපා ඇති බව නොයෙක් වාරවලදී ඔහුගේ ප්‍රකාශන වල සඳහන් කර ඇත. මහාචාර්ය සරචන්ද්‍රයන්ගේ මනමේ නාටකය සේකරයන්ගේ නාට්‍යකරණය සඳහා මහත්සේ ඉවහල් වූ බව ප්‍රකාශනවල ඔහු සඳහන් කර තිබේ.

සේකරයන්ගේ මුල්ම ගීත ඔහුගේ ස්වර්ණතිලකා නාට්‍යයේ දක්නට ලැබේ. එමෙන්ම බොහෝ නාට්‍යවල ගීත ඔහු රචනාකර තිබේ. කරදිය, නලඳමයන්ති වැළිකාලගේ කුණ්ඩලකේශී හා ගුණසේන ගලප්පත්තිගේ -මුදු පුත්තු" නාට්‍යවල ගීත බොහොමයක් මහගමසේකරයන් රචනාකර තිබීම විශේෂයකි. මේ නාට්‍ය ගීත බොහෝ මයක් ජනතාව අතර ජනප්‍රියත්වයට පත්විය. නමුත් ඒ අතරින් ගලප්පත්තිගේ -මුදු පුත්තු" නාට්‍යයේ ගීත ඔහුගේ කාව්‍ය ගීත අතරින් හොඳම ගීත ලෙස සැලකිය හැකිය.

එහි එන සරාගේ මානසිකත්වය ගැන කියවෙන

බිළිඳු තොලක කිරි සුවඳ උරන්නයි
සැමියන් දෙදෙනෙකුගේ සැලකිලිත්
එය ඉතා සතුටින් සරා ලබා ගන්නා අයුරුත්
වෙරළෙන් කිරි කවඩි සොයා
යන ගීතයෙන් කියවේ.

මහින්ද දිසානායක දිවුල්ගනේ

මහගම සේකර ගීත රචකයෙකු ලෙස සාමාන්‍ය ජනතාව හඳුනාගන්නේ ලංකා ගුවන්විදුලි සේවයෙන් ප්‍රචාරය වූ 'මධු විත්ති' සංගීත වැඩසටහන තුළිනි. ශ්‍රී ලංකාවේ විශිෂ්ට සංගීතඥයෙකු වන අමරදේවයන් මේ වැඩසටහන සංගීතවත් කළේය. කෙසේ වෙතත් මේ දෙදෙනාගේ එකතු වීම ගීත ක්ෂේත්‍රය තුල විශාල වෙනසක් හා ආලෝකයක් ඇති කිරීමට සමත්විය. සේකරගේ ගීත රචනා සිංහල ජන කාව්‍යයේ ආභාෂය තදින් ලබා තිබීමත් නිර්ව්‍යාජත්වයත් පෙන්වාදිය හැක.

පිලේ පැදුර හේනට අරගෙන
යනවා

ඉරට මුවාවෙන් ඉඳගෙන

බිංදු බිංදු මල්

ආදී ඉතා ජනප්‍රිය ගීත තුළින් පෙන්වා දිය හැකිය. විශේෂයෙන් ගීතය යනු හුදෙක් මියුරු වාං මාලාවක් පමණක් නොව කිසියම් ජීවිතානු භූක්තියක් ප්‍රකට කලහැකි මාධ්‍යයක් බව ප්‍රකාශ කරන ලද්දේ මහගමසේකරයන්ගේ ගීත තුළිනි. ඔහු විසින් රචනා කරන ලද -සන්නාලියනේ" ගීතයත් තවත් අනෙකුත් ගීත දෙස බලන විටදී සරෝජිනී හායිදු, තාගෝර් වැන්නවුන්ගේ ඇසුර ලබා ඇති බව පෙනේ.

මහගමසේකරයන්ගේ දේශාභිමානී ගීත භක්ති ගීත ප්‍රේම ගීත රසික හදවත තදින් බැඳ ගැනීමට හේතු විය. දේශාභිමානී ගීත අතරින් රත්නදීප ජන්මභූමි වැනි ගීත ඉතා වැදගත් වේ. එපමණක් නොව භක්ති ගීත අතරින් 'ඇසේ මතුවන කඳුලු බිඳු ගෙන' ඔහුගේ ගීතය ඉතා සාර්ථක වූ ගීතයක් ලෙස හැඳින්වීම අතිශයෝක්තියක් නොවේ. ඔහු රචනා කොට ඇති ප්‍රේම ගීත අතරින් 'පාලු අඳුර හිල් අහස මෙයි' නම් ගීතය ඔහු ප්‍රේමය ගැන හෙලූ අළුත්ම දර්ශනයක් මෙයින් ප්‍රකට කිරීමයි.

සේකරයන්ගේ චිත්‍රපට ගීතයට එළඹීම සිංහල සිනමාවේ අභිවෘද්ධිය සඳහාම හේතුවිය. 'හාරිච්චි බෝරිච්චි' සිරිසාර බුලත්විට, ලස්ස ගණන් වස්තු ලැබී (සාරවිට) වෙස් ගන්තෝ චිත්‍රපටය ආදී චිත්‍රපට රාශියක ගීත රචනාකොට තිබේ. ඒවා ජනතාව අතර ජනප්‍රිය වූවා පමණක් නොව චිත්‍රපටියේ ප්‍රමාණය සඳහා ද ඉවහල් විය.

ඔබේ අත දෙන්න

ශ්‍රී ලංකාවේ උපන් ඔබට මහරගම පිළිකා රෝහල එසේත් නැතිනම් රජයේ පිළිකා ආයතනය පිළිබඳ යමක් අමුතුවෙන් කිවයුතු නොවේ. ඒ පිළිකාව පිළිබඳ ඔබ මනසෙහිද යම් යම් තොරතුරු තැන්පත්ව ඇති බැවිනි. අද ඔබ හමුවට තබන මේ තොරතුරු ඒ ආශ්‍රිතව - අපහසුවට පත් වූ වනට සහාය වන්නට පූජ්‍යායතනයක් දරන උත්සහයක් පිළිබඳවය.

මෙම රෝහල ඒ සඳහා ලංකාවේ ඇති එකම රෝහල බැවින් දිනකට 850-900 අතර ප්‍රමාණයක් සායන එන්නත් හා චිකිරණ ප්‍රතිකාර සඳහා පැමිණෙති. දුර බැහැරින් පැමිණෙන සියල්ලන්ම පෙර දින පැමිණිය යුතු වේ. ප්‍රතිකාර ලත් දිනම යාමට ද කාලය නොඑත. එන්නත් හා චිකිරණ ප්‍රතිකාරවලදී ඇතැම් විට සතියක් දෙකක් නතර වීමටද සිදුවේ. විසඳුමක් නොමැති ගැටළුව ඉස්මතු වන්නේ මෙම අවස්ථාවේය. රෝගීන් සමග නතර වන්නේ කොතැනද ? මහරගම නගරයේ නේවාසික පහසුකම් රහිත බැවිනි. එකම සහනදායී පිළිතුර ඇත්තේ රෝහලට යාබද විහාරස්ථානයේය. එහිද 15-20කට වඩා නතරවිය නොහැක. පහසුකම් අතින්ද ඉතා දුර්වලය.

මෙම ගැටළුවට මුහුණදී සිටින රෝගීන්ට හා භාරකරුවන්ට සහාය වන්නට මහරගම තරුණ බෞද්ධ සංගමය උත්සහයක නිරතව සිටී. 1993 ආරම්භ කර ඇති මෙම සංගමය රජයේ අනුමත පූජ්‍යායතනයක් ලෙසත් පාර්ලිමේන්තු පනතකින් ව්‍යස්ථාපිත ආයතනයක් ලෙසත් සම්මතව ඇත. සංගමයේ ප්‍රජාසත්කාරක සේවා සඳහා මේ වනවිට රෝහලට ආසන්නව දෙහිවල පාර, විද්‍යාකර මාවතේ අංක 25 දරණ තැන පර්චස් 32ක ඉඩමක් ද රජයෙන් ලබාගෙන පිළිකා රෝහලට පැමිණෙන රෝගීන්ට හා භාරකරුවන්ට නොමිලයේ නවාතැන් හා ආහාර සපයීමේ ව්‍යාපෘතියක් සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අත්තිවාරම් දමා වැඩ ආරම්භ කර තිබේ. සිව් මහල් ගොඩනැගිල්ලක් වන මෙහි බිම් මහලෙහි ව්‍යාපෘතියේ පළමු අදියර 2009 වසර අවසානයේදී ආරම්භ කිරීමට සංගමය කටයුතු කරමින් සිටී. පළමු අදියර රෝගීන් 30ක් සඳහා පහසුකම් සලසන අතර ඇඳෙහි පහත තට්ටුවේ රෝගියාටද ඉහළ තට්ටුවේ ඔහුගේ භාරකරුවටද වනසේ එක් රෝගියෙකුට තට්ටු ඇඳක් කබඩ් එකක් හා පුටුවක් ද වෙන් කෙරෙන අතර ආන කාමර, වැසිකිළි හා ආහාර ගැනීමට වෙන් වූ ශාලාවකින් ද සමන්විත ටයිල් ඇතිරූ බිමකින් ද යුතු වේ. දෙවන මහල ඉදි වූ පසු රෝගීන් 100කට පමණ පහසුකම් සැලසිය හැක.

මෙම ප්‍රජා සත්කාරක සේවය මෙසේ සැලසුම් කලද 2009 වසර අවසන් වනවිට මෙම ඉදිකිරීම් නිම කරගැනීමට ශ්‍රී ලංකාවේ වත්මන් තත්වය මත හැකිවේදෝ යන සැකයක් දැනට මතුව තිබේ. ඒ ශ්‍රී ලංකාවේ පවත්නා ජීවන වියදම ඉහළ යාමේ තත්වය මත අපේක්ෂිත මහජන ආධාර ලබාගැනීමට ඇති අපහසුතාවය සහ ගොඩනැගිලි ද්‍රව්‍ය මිල ඉහළ යාමය. මේ වනවිට වැලි කියුබ් එකක් රු.6500ක්ද සිමෙන්ති කි. ග්‍රෑ. 50 බෑගයක් රු.700/= පමණද වීම යෙදට උදාහරන දෙස දැක්විය හැක. මේ වනවිට සංගමය ඉඩම වටා ආවරණය කර, නල ජලය හා තෙකලා විදුලිය පහසුකම් ද ලබාගෙන රූපි. මිලියන 2.5 පමණ වැය කර අත්තිවාරම් කටයුතුවල අවසන් මට්ටමට පැමිණ සිටී.
යමෙකු මියගිය පසු ඔහු වෙනුවෙන් අතිවිශාල මුදලක් වැයකර අවසන් කටයුතු අලංකාරව සිදු කර පසුව කලක් පිංපෙත් දී කෙරෙන කටයුතුවලට වඩා ජීවත්ව සිටින විට රෝගී වූ අවස්ථාවේ කෙරෙන උවටැන් හා පහසුකම් රෝගියාටද මානසික සුවයකි. මේ අනුව පිළිකාවේ අවසානය මරණය බව නොරසහසකි. එබැවින් ඔවුනට කිසියම් සහනයක් සැලසීමේ අපේ උත්සහය රෝගියාටද ජීවත්වන ඔවුන්ගේ ඥාතීන්වද සහනයක් බව ඔබද අනුමත කරන බව අපට රහසක් නොවේ.

මෙම ප්‍රයත්නයේදී ආගම ජාතිය මොනම ආකාරයක හෝ ප්‍රශ්නයක් නොවේ. මන්ද පිළිකාවට ලක් වූ ඕනෑම අයකු රෝගියෙකු බැවිනි. රෝගියෙකු කිසිදු බාධාවකින් තොරව ප්‍රතිකාර ලැබිය යුතුමය. එසේනම් කිසිදු නේදයකින් තොරවූ මෙවන් ප්‍රජාසේවා සත්කාරක වැඩසටහනකට ඔබගේ සහය අපේක්ෂා කරන්නට අප අදහස් කළෙමු.

දුර බැහැර විදේශයක ජීවත්වන ඔබේ මව්පියන් හිතවතුන් ජීවත්වන මව්බිමේ රෝගී වන අයට ඔබ උපයන ඩොලර් කිහිපයකින් වටිනා මෙහෙවරක් කළ හැක. ඔබ උපයන මුදලින් සුළු මුදලක් වැය කර යහපත් කාර්යයකට අතනිත දීමට අවස්ථාව දැන් ඔබට උදාවී ඇත. එසේ කරන්නැයි අපි ඔබට ආරාධනාවක් ද කරන්නෙමු.

මෙම සිව්මහල් ගොඩනැගිල්ල අදියරෙන් අදියර තිමා වූ විට ඕනෑම ජෙෂ්ඨ පුරවැසියෙකුට උදේ තම දරුවන් රැකියාවලට ගිය පසු නිවසේ හුදකලා නොවී තම දිවා ආහාරයද රැගෙන පැමිණ මෙම ගොඩනැගිල්ලේ විවෘත වන වැඩිහිටි මධ්‍යස්ථානයට පැමිණ සම වයසේ කණ්ඩායම් සමග පුවත්පත් රූපවාහිනී ආගමික හා විවිධ වැඩසටහන් වලට සම්බන්ධ වෙමින් සිට තම දරුවන් නිවසට පැමිණෙන අවස්ථාව වනවිට තමන්වද නිවෙස්වලට යාමේ අවස්ථාව උදාකර දෙන වැඩිහිටි මධ්‍යස්ථානයක්ද, මහරගම හා අවට ස්වේච්ඡා සංවිධාන හා සමිති, සමාගම් වලට කටයුතු සඳහා ඉඩකඩ සැලසෙන රැස්වීම් ශාලාවක්ද නිර්මාණය වීමට සැලසුම් කර ඇත.

මෙබඳු මහඟු කාර්යයන් රැසකට සෙවන දෙන මෙම ගොඩනැගිල්ලේ කටයුතු සඳහා ඔබේ ශක්ති පමණින් ආධාර කරන්නැයි අප ඔබෙන් ඉල්ලා සිටින්නෙමු. ඔබ ලංකාවට පැමිණි දිනෙක පැමිණ නරඹන්නට මතු දිනෙක ඔබට සතුටට පත් වන්නට හඳපු අවස්ථාවක් උදා කරගන්නට මෙම මහඟු කාර්යයට ඔබත් දායක වන්න. තවත් විස්තර සඳහා ඔබත් අප සංගමයේ වෙබ් අඩවියට පිවිසෙන්න. මේ එහි ඇංකයයි. අඅඅගහපඅ් ජ්ය්ර්ජ්ශදරට ඔබ පිරිනමන ආධාර පහත සඳහන් පරිදි ඔබට පිරිනැමිය හැකි වේ.

, ඔබේ මියගිය සෙනෙහෙබර ඥාතියෙකු වෙනුවෙන් පින් පිණිස හෝ පවුලේ අයකුගේ උපන් දිනයක් වෙනුවෙන් ඔහුට හෝ ඇයට සෙත් පතා කෙරෙන මුදල් පරිත්‍යාග.
, කණ්ඩායමක් හෝ සංවිධානයක් ලෙස කිහිප දෙනෙකු සම්බන්ධ වී මාස්පතා තම වැටුප්වලින් කිසියම් මුදල් ප්‍රමාණයක් එකතු කර මසකට වරක් පරිත්‍යාග කිරීම.
, ගොඩනැගිලි උපකරණ/විදුලිය උපකරණ ඇඳන්, කබඩ්, මේස වැනි උපකරණ සඳහා කැමති සඳහා කෙරෙන පරිත්‍යාග.
, යම් යම් සංවිධාන මගින් ද්‍රව්‍යමය වශයෙන් කෙරෙන පරිත්‍යාග. සංගමයට ලබාදීමට ඔබට හැකි වේ.

මුදල් මගින් කෙරෙන සියළුම පරිත්‍යාග ලංකාවේ සම්පත් බැංකුවේ මහරගම ශාඛාවේ ගි. අ. 101360000436 බැර කරන්න. ඔබට රිසිට් පතක් එවිය යුතු බැවින් ඔබේ නම, ලිපිනය හා එවූ මුදල සඳහන් කර ප්සක?හපඅ් ජ්ය්ර්ජ්ශදරට ලිපිනයට ඊමේල් කරන්න. ගිණුමට මුදල් බැරවී ඊ මේල් තොරතුරු ලද පසු ඔබට රිසිට් පත් තිකුත් කෙරේ. මුදල් පිළිබඳ කිසියම් ගැටළුවක් වෙතොත් සංගමයේ භාණ්ඩාගාරික ගුණදාස අළුත්ගේ මහතාට දුරකථන අංක 0112850773 - (ශ්‍රී ලංකා) මගින් ඇමතිය හැකි වේ.

මේ තොරතුරු පිළිබඳ කිසියම් පැහැදිලි කරගැනීමක් අවශ්‍ය වෙතොත් සංචාරයක් සඳහා පැමිණ පෙබරවාරි මස අවසානය දක්වා මෙහි රැඳී සිටින සංගමයේ ලේකම් සමරසේකර මහතාට අංක 85114071 ට ඇමතීමෙන් සම්බන්ධ කරගත හැක. මෙම ප්‍රජා සත්කාරක සේවය සඳහා මෙතෙක් අපට දැක්වූ අනුග්‍රහය වෙනුවෙන් සන්නස පුවත්පත හා තිසර FM ගුවන් විදුලි සේවාවට ගෞරවයක් ලෙස ලැබෙන සියළුම පරිත්‍යාග පිළිබඳ විස්තර එම ආයතනයට ඊ මේල් මගින් සපයන බැවින් එම තොරතුරු ඔබට දැනගත හැකිවනු ඇත.

ඔබ සැමට තෙරුවන් සරණයි.